
# කුරුළු පවුලට ආ අමුත්තෝ



අශ්මි මෙතුසරි බණ්ඩාර



# කුරුළු පවුලට ආ අමුත්තෝ

ප්‍රථම එළිදැක්වීම - 08.02.2025
ISBN No. 978-624-208-777-1

අශ්මි මෙතුසරි බණ්ඩාර

# පිදුම

මෙම පොත
මගේ ගුරු මෑණිවරුන්ට
හා පියවරුන්ට
පුදමු.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# කණකොකා

## (Indian Pond Heron)

## Paddy Bird

**විද්‍යාත්මක නාමය : Ardeola Grayii**

ජලාශ්‍රිත පරිසරවල ජීවත් වන සතෙකි. සාමාන්‍යයෙන් බෝවීම සිදු වන්නේ ශ්‍රී ලංකාව, ඉන්දියාව, පකිස්ථානය , බංගලාදේශය, ඉරානය හා බුරුමය වැනි රටවල්ය.

කුරුල්ලා



කිරිල්ලි



පැටවුන්



මගේ පාසල මහාමායා බාලිකා විදුහලයි. එය පිහිටා තිබෙන්නේ වැව රවුම ළඟයි. වැව රවුමේ තියෙන ගොඩක් ගස්වල කුරුලු කූඩු ගොඩක් තියෙනවා. මගේ පාසල ළඟ තියෙන ලොකු ගසක කොක්කු වර්ග හා දියකාවෝ ගොඩක් කූඩු වර්ග හදලා තියෙනවා. මේ කූඩු අතර මම දැක්කා කණකොක් අම්මා කෙනෙක් ඉදගෙන ඉන්නවා. ඒ කූඩුව තිබුණේ වැව පැත්තට වෙන්න තියෙන ගසක අත්තක. ඒක නිසා මිනිසුන්ට ළඟා වෙන්න අමාරුයි.







මම දැක්කා කූඩුවේ ළඟ නිල් පාට බිත්තර තුනක් තියෙනවා. බිත්තර තුන විශාලත්වයෙන් වෙනස් බව මට දැණුනා. එම බිත්තර ඉලිප්සාකාර හැඩයක් බව මම දැක්කා. එක බිත්තරයක දිග 5cm පමණ වේ. කිරිල්ලි කූඩුව ළඟ අත්තක ඉද බිත්තර දෙස බලාගෙන සිටියා. කිරිල්ලි බිත්තර රැකීම ටිකකට නතර කළත් බිත්තරවලට හානි වෙයි කියලා බයෙන් ඉන්නේ කියලා මට සිතුණා.



කණකොක් අම්මා කූඩුවේ බිත්තර රකිනවා. ඒත් පරිසරයේ වෙන ශබ්ද ගැන ඉතාමත් හොඳ අවධානයකිනුයි ඉන්නේ අපි ගස ළඟට ගියා විතරයි කිරිල්ලි හැරිලා බැලුවා. කණකොකාගේ හොටේ අග කළු පාටයි. හොට දුඹුරු පාටයි. ඇගේ පිහාටු දුඹුරු හා සුදු පාටයි කුරුලු අම්මා කූඩුව හදනකොට කෝටු කෑලි ගෙන්නේ කුරුලු තාත්තාලු.



අදත් කණකොක් අම්මා සිටියේ කූඩුවේ බිත්තර රකින ගමන්. ඒත් මම දැක්කා බිත්තර දෙකක් එළියට පේනවා. මම ගහ යටට ගියාට පස්සෙ කිරිල්ලි කලබල වුණා. එයා බිත්තර ටික එයාගේ ඇඟට යටකර ගත්තා.





කණකොක් අම්මා කූඩුවේ බිත්තර රකිනවා. අද වැස්ස දවසේ ඒත් කූඩුව නම් එච්චර තෙමෙන්නේ නෑ. කූඩුවට උඩින් කොළවලින් හොඳ වියනක් හැදිලා ඒක නිසා කූඩුව තෙමෙන්නේ නෑ. කිරිල්ලී අනෙක පැත්ත හැරිලා ඉන්නේ හුළං වැස්ස හින්දා ද දන්නේ නැහැ. කූඩුව වටෙන් කොළ නිසා ආවරණය වෙලයි තිබෙන්නේ.





අද කූඩුව ළඟ කලබලයක් කාක්කොත් කෑගහනවා. කොක්කු ටිකකුත් එකතු වෙලා හිටියා. කිරිල්ලිත් කලබල වෙලා. ඒත් එයා කූඩුවෙන් නම් නැගිට්ටේ නැහැ. එයා එයාගේ බිත්තරවල ආරක්ෂාව ගැන හිතනවා. ඒත් මම බිත්තරයක් එළියට දැක්කා.

අද අලුත් දවසක් කිරිල්ලිය කූඩුවේ බිත්තර රකිනවා. කූඩුව හදලා තියෙන්නේ කෝටු කෑලි වලින් අනෙක් පොඩි කුරුල්ලෝ කූඩුව හදන්න සියුම් ද්‍රව්‍ය යොදා ගත්තට මේ අය යොදා ගන්නේ කෝටු කෑලි. ඒ මේ අය අනෙක් කුරුල්ලන්ට වඩා ලොකු නිසා වෙන්න ඇති කෝටු කෑලි යොදා ගන්නේ. එළියේ කෝටු එක එක අතට පෙනුනට කූඩුවේ කුහරය ලස්සනට ඒකාකාරීව තිබුණා. ඒ කූඩුවේ ලොකු කුහරයක් නැහැ.






අදත් කිරිල්ලි කූඩුවේ උඩ අත්තක වහලා සිටියා. බිත්තර තුන ලස්සනට පෙනුනා. කූඩුවේ කුහරය තුළ බිත්තර හොදින් රැදිලා තිබුණා. කිරිල්ලී වටපිට බලනවා මම දැක්කා. කෑම හොයනවා ද දන්නේ නෑ. කිරිල්ලිට බිත්තර රැකගෙන ඉදලා බඩගිනියිද දන්නේ නැහැනේ ?



කිරිල්ලි කූඩුවේ බිත්තර රකිනවා. අද නම් කිරිල්ලි කූඩුවෙන් නැගිට්ටේ නැහැ. ඒ බිත්තරවලයට උනුසුමක් ඕන නිසා වෙන්න ඇති බිත්තර සුරක්ෂිතව ඇගේ ඇඟට යට කරගෙනයි ඉන්නේ. කූඩුව යට පැත්තෙන් වියළි කොළ ගොඩක් එකතු කර ගෙනයි කූඩුව හදලා තිබ්බේ. මෙය මඟින් කූඩුවේ උණුසුම කූඩුව තුළ රැඳවා ගන්නවා ඇති මේ ගසේ කණකොක් කුරුලු කූඩු මෙන්ම සුදු කොකාගේ, දියකාවාගේ කුරුලු කූඩුද මම දැක්කා. මෙය කුඩා ගසක් වුනත් මොවුන් එකට ජීවත් වෙනවා.



අදත් කණකොක් අම්මා කූඩුවේමයි හිටියේ. ඒත් මම දැක්කා අද අම්මා ලඟම සිටිය තවත් කුරුල්ලෙක්. ඒ කණකොක් පවුලේ තාත්තා වෙන්න ඇති. එයා කණකොක් අම්මට වැඩිය ටිකක් ලොකුයි. තද දුඹුරු පාට පිහාටු ගොඩක් ඇගේ තිබ්බා වයිරම් සහිත තද දුඹුරු, සුදු, කහ හා කළු පාටට හුරු පිහාටු වලින් ඇඟ වැසී තිබුනත් පියාපත් යට සුදු පාටයි. ඇගේ වෛරම් වෛරම් වගේ සුදු තිත් තිබුණා.





අදත් මම කුරුළු කුඩුව බලන්න යනකොට හවස් වුණා. කණකොක් අම්මා නම් කූඩුවෙන් නැගිට්ටේ නැහැ. බිත්තර කිරිල්ලිගේ ඇඟට යට වෙලයි ඇත්තේ. කණකොක් තාත්තා අදත් කූඩුව ලඟ සිටියා. එයා අපව දැකලා ඉගිළිලා වෙන අත්තකට ගියා. එතකොට තමයි මම එයාගේ ඇගේ තියෙන සුදු පාට දැක්කේ. "කනකොකා ඉගිලෙනකොට සුද පෙන්නේ" කියලා පිරුළකුත් තියෙනවා පියාපත් යට තිබෙන දිලිසෙන සුදු පාට තමයි අපට පෙන්නේ. පියාඹනකොට හා නැවති සිටින විට වර්ණ දෙකක් ඇති නිසා මොවුන්ට කණ කොකා කියලා හඳුන්වනවා. හැසිරීම අනුව මිනිසුන් හඳුනාගත හැකි වීම, කණකොකා ඉගිලෙනකොට සුද පෙන්නේ කියලා කියන්නේ.

අදත් කණකොක් අම්මා සිටියේ කූඩුවේ, අද නම් කණකොක් තාත්තා පේන්න හිටියේ නැහැ. මම පාසල් ඇරිලා එද්දී කණකොක් තාත්තා කෑම සොයන්න ගිහිල්ලා වෙන්න ඇති. කිරිල්ලිට කෑම සොයාගෙන එන්නේ කණකොක් තාත්තා වෙන්න ඇති.



අද ලස්සන දවසක් මම දැක්කා කූඩුවේ රෝස පාට හමෙන් වැසුණු බෝල දෙකක්. කිරිල්ලිත් කූඩුවේ සිටියා. කිරිල්ලිට පොඩ්ඩක් එහා පැත්තෙන් බිත්තර කටුත් තිබ්බා. මේ පැටවු වෙන්න ඇති. හැබැයි මම හොටේ , ඇස්, තටු වත් දැක්කේ නැහැ.



කණකොක් අම්මා කූඩුවේ සිටියත් එයාගේ බඩට යටින් චුටි රෝස හා කළු පාටට හුරු බෝල දෙකක් දැක්කා. කණකොක් අම්මා කූඩුවෙන් නැගිට්ටේ නැත්තේ පැටවුන්ට උණුසුම දෙන්න වෙන්න ඇත.



අද මට හරිම සතුටුයි. කූඩුවේ ඉන්න පුංචි පැටවු දෙදෙනා මම දැක්කා. බිත්තර තුනක් කූඩුවේ තිබුණාට, හිටියේ පැටවු දෙන්නයි. එක බිත්තරේකට මොකද වුණේ ? ඒ බිත්තරේ කාගේ හරි සතෙකුගේ ගොදුරක බවට පත් වුණාද දන්නේ නැහැ ? දවසක් මම දැක්කා කබරගොයෙක් ඒ කුරුලු කූඩු තියෙන අත්තේ නගිනවා. එයා ද දන්නේ නෑ බිත්තරය කෑවේ.




අද ඉර පායලා තිබුණා අළුත් දවසක් පැටවු දෙන්නත් කූඩුවේ සිටියා. ඔළුවට වැඩිය ඇඟ චුට්ටක් ලොකුයි. ඇඟ කළු පාටයි. ඔළුව රෝස පාටයි. ඇගේ දෙපැත්තේ චුටි අත්තටු දෙකක් තිබ්බා. පිහාටු කොහෙවත් ඇගේ තිබුණේ නැහැ.

අද කුරුලු අම්මා සිටියේ කූඩුව තියෙන උඩ අත්තක. එක නිසා මම කුරුලු පැටවු හොඳට දැක්කා. කුරුලු පැටියාගේ ඔළුවට සාපේක්ෂව ඇස් ලොකුයි. ඇස් වටේ කළු පාටයි. ඔළුව රෝස පාටයි. හොටේ ලා තැඹිලි පාටයි. ඇඟත් රෝස පාටයි හැබැයි තැනින් තැන පුංචි කළු පාට තැන් තිබුණා.



කුරුලු පැටවු චුට්ටක් ලොකු වෙලා තිබුණා. එක පැටියෙක් අනෙක් පැටියට වැඩිය ලොකුයි. එකම දවසක ඉපදුන නිවුන්නුන්ගේ වෙනස්කම් තිබුණා. කුරුලු පැටවු දඟලනකොට මට අසා හිතුනා. ඒත් ඇගේ පිහාටු තිබුණේ නැහැ. අත්තටු දැක්කත් ඒවායේ පිහාටු තිබුණේ නැහැ.





පාසැල් ඇරිලා මම කුරුළු කූඩුව බලන්න ගියා. කිරිල්ලි කූඩුවේම සිටියා. කූඩුව වටේට තිබුණ අතුවල හා කොළවල සුදු පාටට වසුරු තිබුණා. මේවා මේ ගහේ ඉන්න කොක්කු හා දියකාවොන්ගේ වසුරු වෙන්න ඇති කියලා මට සිතුනා. කිරිල්ලිට කූඩුවෙන් යන්න ඕනකම තිබුණත් පැටවු ආරක්ෂා කරන්න ඕන නිසා එතනම සිටියා. ගස යට ඉදලා කූඩුව දෙස බලා සිටිය මගේ



ඔළුවටත් කොකෙක් වසුරු දැම්මා. මම අතින් පිහිදුව අතේ කිරි පාටට ඝන දෙයක් ගෑවුණා. මේවට යුරික් ඇසිඩ් කියලා කියනවා. (Uric Acid) මේවා වාහනවලට වැටුනහම ඒ තැන් මලකඩ කනවලු. යුරික් ඇසිඩ් එළියට දාන්නේ ඒ සඳහා අවශ්‍ය ජලය අඩු නිසා ඒ වසුරුවල කළු පාට ඇට වගේ තිබ්බා. ඒ ඔවුන් කාපු කෑම වල ඉතිරි ජාති.

අද වැස්ස දවසක් කණකොක් අම්මා කූඩුවෙන් නැගිට්ටේ නැහැ ඒ පැටවු තෙමෙයි කියලා අපේ අම්මත් වැස්ස දවසට කුඩයක් ඉහළගෙන අපි ළඟට තුරුලු කරගෙනයි යන්නේ. ඒ අපිව තෙමිලා ලෙඩ වෙයි කියලා. කුරුලු අම්මත් පැටවු ලෙඩ වෙයි කියලා වෙන්න ඇති කූඩුවෙන් නැගිට්ටේ නැත්තේ.



කිරිල්ලිගේ පිහාටු අද ලස්සනට පිම්ඹිලා තිබුණා. කුරුලු පැටවුගේ ඔලුවයි හොටයයි, පිටිපස්සෙන් පෙනුණා. එයාට පැටවුන්ට අනතුරක් කියලා සිතුණ ද දන්නේ නැහැ. පැටවු බයවෙලා වගේ මට සිතුණා. පැටවුන්ට ඉගිලෙන්න බැරි නිසා අනෙක් සත්තුන්ගෙන වෙන්න තියෙන හානි වැඩීය පුංචි කුරුලු පැටවු උරගයින් කපුටන් වැනි සත්තුන්ගේ ගොදුරු බවට පත් වෙනවා.



අද කුරුලු අම්මා කුරුලු කූඩුවේම සිටියා. එයා නැගිට්ටේ නැහැ. අද සීතල දවසක් නිසා පැටවුන්ට උණුසුම දෙන්න වෙන්න ඇති. මම ගහ වටේ ඇවිදින කොට කුරුල්ලන්ගේ බාහිශ්‍රාවීය ද්‍රව්‍ය හෙවත් යුරික් ඇසිඩ් වැටුන කොළ ටිකක් තිබුණා. ඒවා කිරි පාට වෙලා තිබුණා.



අද ඉර එළිය තිබුණ ලස්සන දවසක් කුරුලු අම්මා කූඩුව ළඟම අත්තක සිටියා. හැබැයි එයා පැටවු ගැන හොඳ අවධානෙකිනුයි සිටියේ. කුරුලු පැටවු ලොකුවෙලා. හැබැයි එක් කෙනෙක් අනෙක් පැටියට වඩා ලොකුයි. හොට ලා තැඹිලි පාටයි. ඇගේ පොඩි පිහාටු තිබුණා. ඒවා ලා කළු, දුඹුරු, සුදු යන පාටවලින් යුක්තය. අත්තටුවලත් ගොඩක් පිහාටු ඇවිල්ලා තිබුණා.



අදත් හවස මම කුරුළු කූඩුව බලන්න ගියා. කූඩුව ළඟම කපුටෝ දෙදෙනෙක් කෑගසනවා. කොක් අම්මා ඒ ගැන අවධානයෙන් වටපිට බලනවා. පැටවුන් දෙදෙනා බඩට යටකරගෙන ඉන්නේ, කොක් පැටවුන්ට හානියක් වෙයි. කියලා වෙන්න ඇති. ඒත් ඒ දෙන්නා බඩට යටින් ඔළුව දානවා මම දැක්කා. ඒ දෙන්නත් අපි වගේ දඟයි කියලා මට හිතුනා. කපුටෝ ගිහාම කොක් අම්මා සන්සුන් වුණා.



කුරුළු පැටවු ලොකු වෙලා. ඒ කට්ටියගේ ඇඟ පොඩි පොඩි කටුවලින් වැහිලා තිබුණා අත්තටුවල පිහාටු තිබුණත් කුරුළු පැටවුන්ට තාම පියාඹන්න බැහැ. කුරුළු පැටවු ඉස්සෙල්ලාට වැඩිය ක්‍රියාශීලී කියලා මට සිතුණා.



කුරුළු අම්මා කුඩුවේම සිටියා. ඒත් අද මම පැටවුනම් දැක්කේ නැහැ. වෙනදා අපි ගිහාම කලබල වෙන කුරුළු අම්මා අද කලබල වුණේ නැහැ. එයාට අපෙන් හානියක් වෙන්නේ නෑ කියලා තේරෙන්න ඇති. අද මම ඒ ගහේ ඉන්න තවත් කණකොකෙක් දැක්කා. එයා බෙල්ල දික් කරගෙන වටපිට බලනවා. සාමාන්‍යයෙන් කණකොක්කු බෙල්ල දික් කරන්නේ නැහැ. ඔවුන් බෙල්ල දික් කරන්නේ අනතුරක් සොයා බැලීමට හා ගොදුරු සොයා ගැනීමටත් වෙන්න ඇති සුදු කොක්කුන්ගේනම් කොහොමටත් බෙල්ල දිගයි.



පැටවු දෙන්නා ලොකු වෙලා. ඔවුන් එකටමයි ඉන්නේ. හොටේ තැඹිලි පාට අඩුවෙලා. පිහාටු වලින් මුළු ඇඟම වැහුන නිසා දැන් පැටවු ලස්සනයි. පිහාටුවල පාට කිහිපයක් තියනවා ඒවා කළු, දුඹුරු, සුදු වැනි පාටවලින් යුක්තයි. ඇස් දිලිසෙන කහ පාටයි. මැද කළු පාට බෝලයක් තිබුණා. පැටවු වටපිටාව ගැන හොඳ අවධානයකිනුයි ඉන්නේ.



කුරුලු පැටවු කූඩුවේ සිටියා. කුරුලු අම්මත් ආරක්ෂාවට එතනම සිටියා. අද මට කුරුලු පිහාටු ගොඩක් හම්බුණා. ඒවාට අවේණික පාටකුත් තිබුණා. ඒවා විවිධ හැඩවලින් හා විශාලත්වයෙන් වෙනස් වී තිබුණා. එකම පිහාටුවේ පාට කිහිපයක් මිශ්‍ර වෙලා තිබුණා. ඒවා දුඹුරු, කළු, ලා තැඹිලි හා සුදු පාටවලින් යුක්තයි. මේ පිහාටු කණකොකාගේ පිහාටු කියලා මම අඳුරගත්තා.





අද පැටවු දෙදෙනා කූඩුවේ නම් නොවෙයි සිටියේ. පැටවුන්ට ඉගිලෙන්න බැරි වුණාට කූඩුවේ උඩ අත්තක හරි වහලා එළිය බලන්න පැටවුන් කැමති ඇති. ඇඟ සම්පූර්ණයෙන්ම පිහාටු වලින් පිරිලා තිබුණා. කකුල් ලා කහ පාටයි. අපි දැක්කම පැටවු බයවුණා කියලා මට සිතුණා.



කුරුලු පැටවු දෙන්නා අදත් කූඩුවේ නොවෙයි සිටියේ. කුරුලු පැටවුන්ට දැන්නම් ටිකක් තටු ගසන්න පුළුවන් ලොකු පැටියගේ පිට පැත්තේ දුඹුරු පාට වැඩියි. එයාගේ ඔළුවත් අනෙක් එක්කෙනාගේ ඔළුවට වඩා වෙනස් ලොකු පැටියා පිරිමි සතෙක් වෙන්න ඇති.




කුරුලු පැටවු ලොකු වෙලා එයාලට දැන් ටිකක් පියාඹන්න පුළුවන්. පැටවු එකම ගසේ එක එක අතුවලට පියඹනවා මම දැක්කා. අද මම දැක්කා සුදු කොකෙක් වතුරේ ඉන්නවා. හැබැයි එයා සිටියේ නම් එක කකුලකින්. එයා එක කකුලකින් ඉන්නේ තමන්ගේ ඇගේ උෂ්ණත්වය පාලනය කරගන්න හා මාළු ලේසියෙන් අල්ලගන්නයි. සුදු කොකා එක කකුලකින් ඉන්න කොට මාළු රැවටෙනවා ඒ කෝටුවක් කියලා. එකතොට මාළු ළගට එනකොට කොකාට ලේසියෙන් ගොදුර ලඟටම අරගෙන කන්න පුළුවන්.



කණකොකා ලොකුවට හඬලන සතෙක් නෙවෙයි. එයා හඬනඟන්නේ "ක්ලොක්" "ක්ලොක්" කියා කෙටි සද්දයක් විතරයි. ඒ අනතුරක් හැඟුන විට " කණ කොකා හඬයි" යන පිරැලකුත් සිංහල ජනවහරේ තියෙනවා. එකෙන් කියවෙන්නේ විපතක් හෝ අවාසනාවක පෙර නිමිත්තක්ලු. ඒත් මට නම් එහෙම සිතෙන්නේ නැහැ. අද මට කණකොකා හඬලනවා ඇහුණා. ඔවුන්ට අනතුරක් හැඟෙන්න ඇති. මම නම් ඒක දැක්කේ නෑ. මොනවා උනත් මට නම් අද හොඳ දවසක්.

කුරුලු  පැටවු කූඩුවේ ම හිටගෙන ඉන්නවා මම දැක්කා. ලොකු කුරුලු පැටියාගේ පාට දැන් දුඹුරු පාටයි. බඩ පැත්ත ටිකක් සුදු පාටයි. තාම ඇගේ වෛරම් වැටිලා නැති වුණාට එයා පිරිමි සතෙක් වගේ අනෙක් කුරුලු පැටියා එයාගේ හොටෙන් ඇග කසනවා මම දැක්කා. එයාගේ ඇගේ පොඩි මැක්කො ඉන්නවා ද දන්නේ නෑ.




කණා කොක්කු වැඩිපුරම ගැවසෙන්නේ ජල ආශ්‍රිත ප්‍රදේශවලයි. ඔවුන්ගේ ආහාර වෙන්නේ කුඩා මසුන්, ඉස්ගෙඩියන්, ජලජ කෘමින් හා කක්කොට්ටන් වැනි සතුන්ය. කනකොක් කිරිල්ලි හා කුරුල්ලා මාරුවෙන් මාරුවට පැටවු පෝෂණය කිරීමට කෑම අරගෙන ඇවිල්ලා කවනවාලු. ඒත් මම තාම පැටවුන්ට කවන හැටි දැක්කේ නැහැ. මම හැමදාම එද්දි හවස් වෙන නිසා කුරුලු අම්මායි තාත්තායි පැටවුන්ට කවලා ඉවර වෙන්න ඇති.

කුරුලු පැටවු දෙන්නා තවත් ටිකක් ලොකුවෙලා හොටේ තැම්ලි පාට දැන් අඩුවෙලා. මම දැක්කා එතනම වැව් ඉවුරේ කණකොකෙක් ඉන්නවා වැව් ඉවුරයි පිහාටුවල තියෙන දුමුරු පාටයි දෙකම එක වගේ නිසා එයාව එකපාරම අදුරගන්න බැහැ. ඒක ඔවුන්ගේ ආරක්ෂක උපක්‍රමයක් ලෙස භාවිතා කරනවා. මේ නිසා කණකොකා ගොදුරු කරගන්න අමාරුයි.



කුරුලු පැටවු දෙන්නා මම එනකොට හැංගෙනවා. ඔවුන් තාම පරිසරයට හුරු නැතිව ඇති අද මම දැක්කා කනකොකෙක් වැවේ නිසොල්මනේ ඉන්නවා. මෙහෙම ඉන්නේ ගොදුරක් සොයාගන්න වෙන්න ඇති බක තපස් රැකීම කියලා සිංහල වහරේ කියමනක් තියෙනවා. කණකොකාගේ කකුල් සුදු කොකාගේ තරම් දිග නෑ කියලා මට තේරුණේ එයා වතුරේ ඉඳිද්දි. හැබැයි අනෙක් කුරුල්ලන්ට වඩා දිගයි. හීනියි, පාට කහ පාටයි. උඩ කොටස පිහිටුවලින් වැහිලා තිබුණට යට කොටස පිහාටු වලින් වැහිලා නැහැ. ඇඟිලි හිනියි, දිගයි, ඇඟිලි තුනක් ඉදිරියට නෙරා තිබුණත් එක ඇඟිල්ලක් පිටුපසට නෙරා තිබුණා. ඉඟිළෙද්දි කකුල් පිටුපසට කරනවා.





කුරුලු පැටවු කුඩුවේ සිටියා. ඒ දෙන්නාගේ පිහාටුවලින් හම පිරිලා කුරුලු පැටවුගේ කකුල් කහ පාටයි. අපි දැක්ක ගමන් ඒ දෙන්නා කලබල වෙනවා. කුඩුවෙන් වෙන අත්තකට පියාඹලා හැංගෙනවා.



අද මම දැක්කා සුදු කොක්කු ජෝඩුවක් අලුතින් කුඩුවක් හදනවා. තාත්තා කෝටු කෑලි ගෙනල්ලා දෙනවා. දෙන්නම එකතුවෙලා කුඩුව හදනවා. මම කුඩුවෙන් යට පැත්තේ වියළි කොළ තියෙනවා මම දැක්කා මේ කුඩුවත් කණකොක් කූඩුව වගේ වෙයි ද දන්නේ නැහැ.

පැටවු දෙන්නා අතුවල සිටියා. එක පැටියෙක් නම් මට හොඳට පෙනුනා. එයා බෙල්ල දික් කරගෙන සිටියා. එයා ගේ බඩ පැත්ත සුදු පාටයි. ලොකු කුරුලු පැටියා අතුවල හැංගිලායි සිටියේ. එයාගේ පිට පැත්ත නම් තද දුඹුරු පාටයි. අද මම ඒ ගසේම උඩ අත්තක තියෙන දියකාවොන්ගේ කූඩුවක් දැක්කා. ඒ කිරිල්ලි කූඩුවෙන් එලියට ඔළුව දාගෙන සිටියා. පිටතින් බැලුවම  කූඩුව වටේම වියළි කොළ එකතු කරළා තිබුණා. මැද කුහරය ගැඹුරුයි කියලා මට සිතුණා. ඒ කූඩුව කොක්කුන්ගේ කුඩු වලට වැඩිය වෙනස්. කොක්කුන්ගේ කුඩුව කුහරය හරිම අඩුයි. වියළි කොළ යොදාගෙන තියෙන්නේ හරිම අඩුවෙන්.





කුරුලු පැටවු දැන් ටිකක් ලොකුයි. අත්තෙන් අත්තට පියඹනවා එත් ගහකින් ගහකට පියඹන්න අමාරු ඇති. තාම හොඳට පියාඹන්න බැරි නිසා කුරුලු අම්මා ඔවුන්ව ආරක්ෂිත තැනකින් තියාගෙන ඉන්නේ.
සුදු කොක්කු ජෝඩුව කුඩුව හදලා ඉවරයි. කිරිල්ලි කූඩුවේ ඉන්නවා. එයත් බිත්තර දලාද දන්නේ නෑ ?



පැටවු දෙදෙනට ගසේ උඩ අතු දෙකක සිටියා. හොටේ කහ පාට වගේම දුඹුරු පාටත් තියෙනවා. අම්මයි තාත්තායි පැටවු අසලම ඉන්නවා මම දැක්කා.







මේ කොක්කු ඉන්න ගස අසළම තවත් කුරුල්ලෙක් ඉන්නවා මම දැක්කා. එයා වැව් ඉවුරේ හා ගසක අත්තක වහලා ඉන්නවා මම දැක්කා. මම එයා ගැන හොයලා බැලුවහම එයා රෑ කොකෙක්. එයාගේ ඔළුව පිට පැත්ත කළු පාටට හුරු නිල් පාටයි. දෙපැත්තේ අළු පාට පිහාටුත් තිබුණා. ඇස රතු පාටයි. රෑ කොකාගේ කකුල් අනෙක් කොක්කු විශේෂවලට වැඩිව කොටයි. එයාගේ බඩ පැත්ත සුදු පාටයි. එයාගේ ගෙළ පිටුපසින් එල්ලෙන සුදු දිග පිහාටු දෙකක් තියෙනවා. හොට කළු පාටයි. රෑ කොකා කියලා හඳුන්වන්නේ එයා රෑට ක්‍රියාශීලි වෙන නිසයි. ඒත් දවල් කාලයෙත් මම රෑ කොකාව දැක්කා.

අද මම යනකොට කොක්කු ඉන්න ගහ ළඟ කලබලයක්. කපුටොත් කෑගසනවා. පැටවු දෙන්නා ගසක අත්තකට මුවාවෙලා බයෙන් වගේ ඉන්නවා මම දැක්කා. සුදු කොක්කු ජෝඩුවක් එතන ඉඳන් කෑගසනවා. එතකොට මම දැක්කා ඒ කූඩුවෙන් ලා නිල් පාට බිත්තර තුනක් තියෙනවා. එගොල්ලෝ කෑ ගහන්නේ ඒවා ආරක්ෂා කර ගන්න වෙන්න ඇති ඒ බිත්තර කණකොක් බිත්තර ප්‍රමාණයමයි. මම දැක්කා සුදු කොකාගේ ගෙළ පිටුපසින් සුදු දිග පිහාටු දෙකක් තියෙනවා. සුදු කොක් තාත්තාත් එතන ඉඳලා කෑගසනවා. අම්මයි තාත්තායි බිත්තරවලට හානි වෙයි කියලා බයෙන් ඉන්නේ.



මම අද අන්තර්ජාලයෙන් කුරුල්ලෙක්ගේ කොටස් දැනගත්තා.



කුරුලු පැටවු දෙන්නා ටිකක් ලොකු වෙලා. දැන් කුරුලු පැටවු වෙන වෙනම අඳුරගන්න පුළුවන්. එක පැටියෙක් කිරිල්ලියක්, අනෙක් පැටියා කුරුල්ලෙක් මෙය අඳුරගන්නේ ඔවුන්ගේ පිහාටුවලින් දෙන්නාගේ පිහාටුවල පාටවල වෙනස්කම් තිබුණා. කිරිල්ලිගේ පිහාටු වල පිට පැත්ත දුඹුරු පාටයි බඩ පැත්ත සුදු පාටයි. කුරුල්ලන්ගේ පිටපැත්ත තද දුඹුරු පාටයි. දැන් කුරුලු පැටවු ඉන්නේ අතුවල. කූඩුව කැඩෙන්න පටන් අරන්.



කුරුලු විශේෂ වෙන්කර හඳුනා ගැනීමට පිහාටු අපට වැදගත් වෙනවා. කුරුලු පිහාටුවලින් කුරුල්ලන්ට විශේෂ ප්‍රයෝජන රැසක් ලැබෙනවා.

එවා නම් :

ÿ ශරීරයේ උෂ්ණත්වය පාලනය කර ගැනීමට /පිහාටු අතර වායු ධාරාවක් රඳවා ගත හැකි නිසා ශරීර උෂ්ණත්වය පාලනය කර ගත හැකිවීම.
ÿ පියෑඹීමට
ÿ ආරක්ෂාවට/ සැඟවීමට
ÿ වතුර රදා නොසිටීමට
ÿ ජලයේ පාවීමට හා පිහිනීමට
ÿ ස්නායු උත්තේජනය කළ හැකි වීම
ÿ ශරීරයේ පිරිසිදුව තබා ගැනීමට



# කුරුලු පිහාටුවක කොටස්

අද මම දැක්කා තව සුදු පාට කොක්කු විශේෂයක් වැව් ඉවුරේ ඉන්නවා. එයා සුදු කොකාට වැඩිය පොඩියි. ඔළුව හා බෙල්ල පිටුපස රන්වන් පාටයි. මෙයාට කියන්නේ ගව කොකා කියලා ගව කොකා වැඩිපුරම ඉන්නේ ගවයෝ ඉන්න තැන්වල එකයි එහෙම කියන්නේ.



කණකොක් කූඩුව දැන් කැඩෙන්න පටන් අරන් පැටවුන්ට දැන් හොඳට පියාඹන්න පුළුවන් හැබැයි තාම කුරුලු පැටවු වෙන ගසක අත්තකට පියඹලා ගියේ නැහැ. පොඩි ශබ්දයක් ඇසුණත් කුරුලු පැටවු දෙන්නා ගසේ උඩ අත්තකට පියඹලා ගියා. කුරුලු අම්මයි, තාත්තායි පැටවු ළඟම ගැවසෙනවා මම දැක්කා මාගේ අම්මයි,තාත්තායි වගේ කුරුලු අම්මයි තාත්තායි පැටවුන්ගේ ආරක්ෂාවට ළඟින්ම ඉන්නවා. තව ටික දවසකින් මේ කුරුලු පැටවු ලොකු වෙලා වෙන ගසකට පියඹලා යාවි. එදාට කුරුලු අම්මයි තාත්තායි දුක් වේවිද දන්නේ නැහැ.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්